## 1.1 හැඳින්වීම

කිසියම් කලාවක් කොයි ලෙසින් ගත්තද, එය ආමන්ත්‍රණය යොමුව ඇත්තේ ප්‍රේක්ෂක, පාඨක, රසික හෝ ශ්‍රාවක හැඟීම් උද්දීපනය කරන අටියෙනි. මෙහිදී සිනමාව මූලික තැනක් ගනියි. සිනමාව ආරම්භ වී දැනට වසර සියයකටත් අධිකය. ආරම්භක යුගයේ චිත්‍රපටවල දක්නට ලැබුණේ නිහඬ ක්‍රියාකාරී බවකි. මෙම ගති ලක්ෂණ පුළුල් වී කලා මාධ්‍යයක් වශයෙන් වැඩීමට සෑහෙන කාලයක් ගතවිය.

කතානාද චිත්‍රපටය බිහිවීමත් සමගම පියවි ලෝකය තවත් පුළුල් වූවාක් මෙන් විය. එහිදී කිව හැකි කාරණය වන්නේ කතානාද චිත්‍රපටයේ ප්‍රබලත්වයට හේතුව, යථාර්ථය ග්‍රහණය කරගැනීමට එහි ඇති ශක්තියත්, නළු නිළියන්ගේ රඟපෑම් තුළින් අඩුවැඩි ලෙස ඉදිරිපත් කළ හැකි මායාකාරී බවත් එය සතුව ඇති බවය. මෙලෙස ආරම්භ වූ සිනමා ගමන් මග 70, 80 දශකවල උච්ච ස්ථානයක පැවතුනද 90 දශකය මැදභාගය වනවිට යම්කිසි පරිහානියකට පත්වන ලකුණු පහළ වන්නට විය. සිනමාවෙහි විවිධ යුගයන් තුළ නැගීම් හා බැසම් ඇති විය. ඒ ඒ කාලවකවානුවල බිහි වූ විවිධ වූ සිනමා කෘති ප්‍රේක්ෂක ආකර්ෂණය කෙරෙහි හේතුවිය. ඒ යුගවල තිබූ සමාජ, දේශපාලනික, ආර්ථික වෙනස්වීම් සිනමාව කෙරෙහිද බලපෑවේය. විවිධ සිනමා නිර්මාණ හරහා එකල පැවති සමාජ ස්වභාවය ඉස්මතු විය.

කාලයෙන් කාලයට සිනමාව තුල විවිධ වෙනස්වීම් ඇතිවෙයි. විවිධ රැළි ඇතිවෙයි. නමුත් ඒවායෙහි පැවැත්ම තීරණය වන්නේ ප්‍රේක්ෂකයා ඒවා වැළඳ ගැනීමෙහි ස්වභාවය අනුවය. මෙම සිනමා නිර්මාණ කෙරෙහි ප්‍රේක්ෂකයා කෙතරම් අභිප්‍රේරණයක් දක්වන්නේද යන කාරණය මත මෙහි පැවැත්ම තීරණය වේ.

අද්‍යතන සිනමාව තුළ වන ප්‍රේක්ෂක අභිප්‍රේරණ ගතිකයන් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී තහවුරු වන දෙයක් නම් ප්‍රේක්ෂකත්වය විවිධාකාර බවය. මෙහිදී එකී ප්‍රේක්ෂකත්වයේ විවිධත්වය තහවුරු කිරීම සඳහා අධ්‍යයනය කිරීම සඳහා මා විසින් චිත්‍රපට 3 තෝරාගෙන ඇත.

- අබා
- මචං
- වලාපටල යනු එම චිත්‍රපට ත්‍රිත්වයයි.

මෙම චිත්‍රපට ත්‍රිත්වය හරහා එකිනෙකට වෙනස් මානයන් පිළිබඳව කතාවට ලක්කරයි. මෙහි වන පොදු ලක්ෂණය වන්නේ චිත්‍රපට තුනම එකම කාලයක ප්‍රදර්ශනය වූ ඒවා වීමයි. නමුත් මෙහිදී ප්‍රේක්ෂකයන් මෙම සිනමා කෘති ත්‍රිත්වයට ආකර්ෂණය වූ ආකාරය එකිනෙකට වෙනස්කමක් දක්වයි. ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම නිබන්ධනයේ මූලික පරමාර්ථයයි.

ලාංකේය වීරකතා සම්ප්‍රදායට නව මානයක් ලෙසින් 'අබා' සිනමා කෘතිය කරළියට එයි. ඒ හරහා බොහෝ පිරිසකගේ අවධානය එයට යොමුවිය. විශේෂයෙන්ම සිනමාව පිළිබඳව ඇල්මැරුණු ආකල්ප තිබූ යුගයක නව ප්‍රබෝධයක් ඇති කිරීමට 'අබා' චිත්‍රපටය සමත් වෙයි.

'මචං' සිනමා කෘතිය ගත් කළ, එයද මෙම කාල පරාසය තුළම ප්‍රදර්ශනය කළ සිනමා කෘතියකි. 'අබාට' වඩා හාත්පසින්ම වෙනස් සිනමා කෘතියක් වුවද එයට ප්‍රේක්ෂකත්වයේ අඩුවක් නොවීය. සාම්ප්‍රදායිකත්වය ඉක්මවා ගිය, ආකෘතික සීමාවෙන් මිදුනු සිනමා කෘතියක් ලෙස එය හැඳිනීම නිවැරදි වේ.

'වලාපටල' යනු එම කාලය තුළම කරළියට පැමිණි අනෙක් සිනමා කෘතියයි. ඉහත සිනමා පරමාර්ථයන් දෙකටම වඩා මෙහි අන්තර්ගතය වෙනස්ය. මෙය ඉතා හොඳ සිනමා කෘතියක් ලෙස නොමඳ සම්භාවනාවට පාත්‍ර වුවද මෙහි ප්‍රේක්ෂකත්වයේ අඩුවක් දක්නට ලැබුණි. ඉතා ඉක්මනින් සිනමාශාලා වලින් නාම පුවරු ඉවත්ව යන තත්ත්වයක් මෙයට උද්ගත විය. උසස් නිර්මාණයක් වුවද ? මෙය සිනමා ශාලාවලින් ඉවතට විසිවූයේ මන්ද ? යන්න අවධානයට යොමුකළ යුතු කාරණයකි.

මේ අන්දමට එකිනෙකට වෙනස් වූ සිනමා කෘති තුනක් අධ්‍යයනයට ගැනීම තුළ, ප්‍රේක්ෂකයා චිත්‍රපටය කෙරේ පෙළඹවීම, සිනමා පටයට ප්‍රේක්ෂකයා නතුවන්නේ කුමන කාරණා මත පදනම්වද, ඔහුගේ මානසික තත්ත්වය ආදිය පිළිබඳව අවධානයට ලක්කිරීම මෙහිදී සිදුවේ.

මේ අන්දමට අද්‍යතන සිනමාව තුළ ඇති ප්‍රේක්ෂක පෙළඹවීම් වෙනස්කම් හඳුනාගැනීමත් ඒවා අධ්‍යයනය කිරීමත් මෙහිදී සිදුකරයි. වර්තමානයේ සිනමා ප්‍රේක්ෂකයා හා සම්බන්ධිත පර්යේෂණ සිදුකිරීම් අල්ප බැවින්ද, එසේම ප්‍රේක්ෂකයා සම්බන්ධ පර්යේෂණ කිරීම් කාලීන වශයෙන් වැදගත් යයි සිතන හෙයින්ද මෙය තෝරාගැනීමට බලපෑ හේතුව විය. මේ අනුව අද්‍යතන සිනමාවේ ප්‍රේක්ෂක අභිප්‍රේරණ ගතිකයන් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම නිබන්ධනයේ මූලික අරමුණයි.

## 1.2 ගැටලුව

සිනමා නිර්මාණ කෙරෙහි පෙළඹවීමේ වෙනසක් ප්‍රේක්ෂකයා තුළ දැකිය හැකිද ?

## 1.3 උපන්‍යාසය

සිනමා නිර්මාණ කෙරෙහි ප්‍රේක්ෂක පෙළඹවීමේ වෙනසක් දැකිය හැකිය.